


# මමයි නුඹේ වියපත් බඹරා

ගීතය පිළිබඳව සංගීතය පිළිබඳව උනන්දුවක් ඇති පාඨකයින් සඳහාම වෙන්වන්නකි "ගි සඳළුව". මෙල්බර්න් පුරවරයේ පැවැත්වෙන කිනම් හෝ ගීතමය අවස්ථාවක් වේ ද, ඒ පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීම අපගේ එක් අරමුණකි. මව් බිමේ හෝ වේවා, අප අතර සිටින හෝ වේවා යම් ශිල්පියෙකු, ශිල්පිනියක හෝ පිරිසක් මෙහි ඉදිරිපත් කරන ගායනා පිළිබඳව අප පාඨකයින් යොමු කරවන්නේ ලිඛිතව පමණක් විස්තර කළ නොහැකි මියැසිමය කාරණා පිළිබඳ විඳගන්නට ආරාධනා කරමිනි. රසිකයින්ගෙන් පිරී ඉතිරී යන ප්‍රේක්ෂකාගාරයක් ශිල්පියෙකුගේ ප්‍රධාන අපේක්ෂාවයි. ඒ හුදෙක් මූල්‍යමය අවශ්‍යතාව පදනම් ව නොවේ. තමාගේ කාර්ය වඩාත් උනන්දුවෙන් හැඟීම්බරව ඉදිරිපත් කරවීමට උත්තේජය සපයන, උද්දීපනය කරවන කාරණය රසික ප්‍රතිචාරය වන නිසාවෙනි.

නුදුරේදී පැවැත්වීමට නියමිත සුරම්‍ය රාත්‍රිය ප්‍රසංගයේ ප්‍රධාන ගායන ශිල්පියා වන අමරසිරි පීරිස් ප්‍රවීණ ගායන හා විශිෂ්ට වයලින වාදන ශිල්පියා දුරකථනයෙන් අපි " ගී සඳළුව" වෙනුවෙන් සම්බන්ධ කර ගත්තෙමු.

"මං කැමතියි "මගේ පුංචි රෝස මලේ " ගීතය ගැන කතා කරන්න....." දුරකථනයේ එහා කෙළවරින් අමරසිරි ප්‍රවීණයාගේ භාව පූර්ණ හඬ ගලා එන්නට විය. "ඇත්තටම දැන් මේ සිංදුව මෙහේ ජනප්‍රිය සිංදුවක්. ඩෙනිසටර් පෙරේරා මහත්මයාගේ තනුවක්."

"මේ ගීත රචනය අතට ලැබුණාම මට හිතුණා මේ ගීතය මම ගායනා කළාට කමක් නැද්ද කියලා. මොනවා වුණත් මං කල්පනා කළා යථාර්තයක්නේ කියවෙන්නේ. ඇයි අපි යථාර්තය හංගන්නේ. හංගන්න බෑනේ සිසිර...."

කලකට පෙර "තුන් සිතක ගී" ප්‍රසංගයේ මෙම ගීය හඳුන්වා දුන් අන්දමින් ම සිය අත්දැකීම විස්තර කරන්නට පටන් ගත්තේය ,ශිල්පියාණන්

"ගීතයේ පසුබිම් කතාව මෙහෙමයි. මම ගුවන්විදුලියේ වැඩකරන කාලයේ වැඩසටහනක් තිබුණා අලුත් අයව හඳුන්වලා දෙන. ඉතින් ඒ වැඩසටහනට ඔය ඉස්කෝලේ යන දරුවන්ගේ එහෙමත් දස්කම් ඉදිරිපත් වුණා. දවසක් මම ගුවන් විදුලියේ කොරිඩෝවක් දිගේ එනකොට මට මුණ ගැහුණා අපේ ප්‍රවීණ ශිල්පියෙක්. හොඳ වයලින් වාදකයෙක් වගේම ජනප්‍රිය ගායන ශිල්පියෙක්.

"කවුද කියලා කියන්න බැරි ද ?"

"එහෙම හොඳ මදිනේ.... දැන් එතුමා අපි අතරෙ නෑ." පීරිස් සංගීතවේදියාගේ සිනා හඬින් අපගේ සවන් පිරී ගියේය.

"ඉතින් මේ කියපු ශිල්පියා සංගීත ගුරුවරයෙක් නිසා මම කිව්වා; "අරන් වරෙන්කෝ දක්ෂ ළමයි ඉන්නවනම්.... අපිට පුළුවන්නෙ වැඩ සටහනට ඉදිරිපත් කරන්න" කියලා. ඉතින් පස්සේ දවසක මේ වියපත් ශිල්පියා තමන්ගේ ගෝලයෙක් ව අරගෙන ආවා වැඩසටහනට ඉදිරිපත් කරන්න. ඇත්තටම ලස්සන ඉස්කෝලෙ යන ශිෂ්‍යාවක්. හරිම දක්ෂ විදියට තමන්ගේ වාදනය ඉදිරිපත් කළා.

"මොකක් ද ඒ භාණ්ඩය ?" මේ කවුරුන්දැයි හඳුනාගන්නට හරස් පැනයක් ඉදිරිපත් කළෙමු අපි.

"බෑ.... බෑ..... ඒක කිව්වොත් අපේ යාළුවා කවුද කියලා සිසිරට අහුවෙනවා...." නැවතත් සිනා හඬින් සවන් ඉතිරී ගියේය.

ඉතින් අපේ වියපත් යාළුවට මේ පාසල් දැරිය පිළිබඳ හිතක් පහළ වෙලා. ඒ වුණාට අනේ ඒ ළමයා දන්නෙවත් නෑ. අපේ යාළුවත් අපෙන් සඳහටම වෙන් වෙනකල්ම එළි කළෙත් නෑ. හැබැයි ඔය කතාව මට විතරක් කිව්වා අර වැඩසටහන කෙරෙන අතරෙදි. ඒ නිසාම මාත් බලාගෙනයි උන්නෙ පස්සෙ මොනවද වෙන්නෙ කියලා. ඇත්තටම අතකින්වත් අල්ලලාත් නෑ. මොකුත් උනේත් නෑ. ගුරායි ගෝලයායි විදියටම තමයි හිටියෙ."

වියපත් වූ පමණින් ම පුද්ගලයෙකුගේ හැඟීම් වියපත් වියයුතු යයි නියමයක් නොවේ. වියපත් වූවෝ ද ජීවිතයේ සුන්දරතාවන්, ලොව සුන්දරතාවන් විඳිති. අගයති. ඔවුන්ගේ හැඟීම් වියපත් නොවූව ද සදාචාරය, මිනිස්කම් යනාදී ආචාර්ය ධර්මතාවලින් බන්ධනගතව සිටිනා නිසාවෙන් තමන්ට රිසි සේ හැසිරිය නොහේ. එසේ වුවද අතිමිත්‍ර සහෘදයෙකුට පමණක් සිය හැඟීම් ප්‍රකාශ වන අවස්ථා අතර එක් නිදසුනකි මේ.

"ඉතින් පස්සෙ කාලෙක මම මේ කතාව කිව්වා අපේ හිතවත් සිංහල ගුරුවරයෙකුට. ඒ තමයි ධම්මික බණ්ඩාර මහත්තයා. ධම්මික තමයි මේ වචන ටික මට ලියලා දුන්නේ. මං අර කලින් කිව්වා වගේ සිද්ධියක් දැනගෙන උන්නට සින්දුවක් විදියට මේක කියනවද කියලා මට මුලින්ම ප්‍රශ්ණයක් හිතට ආවා. මොනවා වුණත් අපිත් පවුල් පන්සල් වුණ, දරුවො ඉන්න වැඩිහිටියොනේ. ඒත් ඇයි ඉතින් අපි යථාර්ථය හංගන්නේ ?"

අමරසිරි පීරිස් සංගීතවේදියා අපෙන් අසයි. මව් බිමේ ශබ්දාගාරයක හඬ කවමින් සිටිනා අතරේදීයි ඔහු අප වෙනුවෙන් කාලය බිඳක් වැය කළේ. වේලාව වෙන් කර ගැනීමේ යටියෙන් කතා කළද එවේලෙහිම සිය අත්දැකීම අප වෙනුවෙන් විස්තර කිරීමට උනන්දු වීම පිළිබඳව බෙහෙවින් ම ස්තූතිවන්ත වන්නෙමු අපි. ටික වේලාවක් පමණක් කාලය ඉතිරිව තිබුණු දුරකථන පතේ කාලය අවසන් වීමෙන් කථිකාව අතරවාරයේ දුරකථනය විසන්ධිවීම පිළිබඳව අපගේ කණගාටුව ද ශිල්පියාණන්ට පළ කළෙමු ඒ සමඟින්.




මගේ පුංචි රෝස මලේ
මමයි නුඹේ වියපත් බඹරා
නුඹ හීනෙන්වත් නොදකින්
කුමරා

කරුවල රෑ සඳක් වගේ
අහසේ නුඹ ඉන්නවනම්
ආසයි මම නොකී කවිය
නුඹට කියන්න
තරහක් නෑ නුඹ බැසයන්න

මගේ පුංචි නවාතැනේ
ඇවිදින් සැරිසරනවනම්
ආසයි මං
කවුළු පියන් ඇරලා තියන්න
තරහක් නෑ නැවිත් ඉන්න

රචනය : ධම්මික බණ්ඩාර
තනුව : ඩෙනිස්ටර් පෙරේරා




ඔබේ සුසුදු දෑඟිලි මත හිඳින්නට රැඳී
නෙලාගන්න පමා නොවී තව තවත්
පෙති විකසිත සිඟිති කුසුම
උපන් ඔබ නමින්
නල රල වැද නටුවෙන් මිදවී
මැලැවී ගොස් පෙති පෙති ගිලිහී
දුහුවිල්ලට මුසුවෙලා
මියෙන්නට කලින්

නොතරම් මුත් රැඳවෙන්නට
ඔබේ ගෙලේ පැලැරැකෙෂන්නට
සුසුදු සුවඳ මාලතී
මල් දමෙහි මලක් වී

නෙලා ගන්න සිඟිති කුසුම
නිදන්න පෙර හිරු ගිලිහී
අඳුරේ මා සඟවලා
මල් පුදන පැය ගෙවී

විඳින්න මට වේදනාව
ඔබේ නමින් මිලානවී
සුවඳක් වී රැඳවිලා
නෙත් පියන සැනසුමේ

සිඟිති පැහැය පැහැබර නැති
සිඟිති සුවඳ සිඟිති සිඟිති
සිඟිති සිඟිති මලක්මයි ඉතින්
එන්න... ඔබේ ඇඟිලි තුඩින්
නෙලාගන්න සිඟිති කුසුම
පමා නොවී තව තවත්
ගෙවී සැඟව යන්නට පෙර
ආදරබර සොඳුරු මොහොත
පෙති විහිදා හිනැහෙනා...

Pluck this little flower and take it" delay not` I fear lest it droop and drop into the dust'

I may not find a place in thy garland" but honour it with a touch of pain from thy hand and pluck it' I fear lest the day end before I am aware" and the time of offering go by'

Though its colour be not deep and its smell be faint" use this flower in thy service and pluck it while there is time'

*රබීන්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු